**ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 06/2018** 2018 ඔක්තෝබර් 09

**සියළුම බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය ආයතන සහ බලපත්‍රලාභී ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,**

## දේශීය මුදල් ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම

දේශීය මුදල් ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම හා දියුණු කිරීම පිණිස 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනතෙහි 44 වැනි වගන්තිය ප්‍රකාරව එකී පනතේ 4 වැනි වගන්තිය සමඟ කියවිය යුතු මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. LANKAQR පිරිවිතර (යාකරය 1) නමින් ජාතික QR කේත ප්‍රමිතියක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙයින් නිකුත් කරනු ලැබේ.

මෙම චක්‍රලේඛය 2018 ඔක්තෝබර් මස 9 වන දින සිට බලපැවැත්වෙන අතර, QR කේත ආශ්‍රිත ගෙවීම් ක්‍රමයන් ඉදිරිපත් කරන සියළු බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය ආයතන හා බලපත්‍රලාභී ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන් විසින්, චක්‍රලේඛය නිකුත් කිරීමෙන් මාස 6 ක් ඉකුත් වීමට පෙර එයට පූර්ණ වශයෙන් අනුකූල විය යුතුය.

1. **නිර්වචන**

LANKAQR කේතයක් මඟින් ආරම්භ කරනු ලබන ගනුදෙනුවකදී සියළුම අපේක්ෂාවන් සහ අභිප්‍රායන් සඳහා පහත සඳහන් පාර්ශවකරුවන් නිර්වචනය කර ඇත.

1.1 **නිකුත් කරන්නා** - QR කේත පදනම් කරගත් ගෙවීම් සිදු කිරීම සඳහා භාවිතා කරන ජංගම ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම්, ණයවර පත් ගිණුම් හා ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් ගිණුම් සඳහා පහසුකම් සපයන ආයතන.

1.2 **අත්පත්කරුවා** - වෙළෙඳුන් බඳවා ගැනීම, වෙළෙඳ හැඳුනුම්පත් අංක වෙන් කිරීම, වෙළෙඳුන් සඳහා වාර්තා/ගිණුම් පවත්වා ගෙන යාම සහ වෙළෙඳ ගිණුම් පියවීම සඳහා වගකිව යුතු මූල්‍ය ආයතන හෝ ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන් වෙළෙඳුන් මඟින් ඉදිරිපත් කරන LANKAQR කේත උත්පාදනය කිරීමටද අත්පත්කරුවා පහසුකම් සලසනු ලැබේ.

1.3 **නිෂ්කාශන ජාල නියාමකයා** - නිකුත් කරන්නා හා අත්පත්කරුවා එකිනෙකට වෙනස් වන අවස්ථාවන්හිදී, ගනුදෙනුවට පාර්ශව වන මූල්‍ය ආයතන අතර ගනුදෙනුව මෙහෙයවීමට නිෂ්කාශන ජාල නියාමකයා (ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම) වගකියනු ලබයි.

1.4 **ජංගම අයදුම් මෘදුකාංග සපයන්නා** - LANKAQR කේත භාවිතා කරන ගනුදෙනු සඳහා පහසුකම් සැපයීමට අවශ්‍ය ජංගම දුරකථන පදනම් කරගත් ගෙවීම් ක්‍රමයන් සපයන පාර්ශවය. මෙය මූල්‍ය ආයතනයක තුන්වන පාර්ශ්වීය යෙදවුම් සපයන්නෙකු හෝ අත්පත් කරගන්නා ආයතනයක් විය හැකිය.

1.5 **ගනුදෙනු අත්පත්කරුවා** - ගනුදෙනු අත්පත් කර ගැනීම සඳහා ජංගම යෙදුම් මෘදුකාංග සපයන්නන් හට පහසුකම් සපයන මූල්‍ය ආයතනය හෝ ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවා, ගනුදෙනු අත්පත්කරුවා ලෙස හැඳින්වේ. මෙම පාර්ශවය, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම හෝ වෙනත් අදාළ ගෙවීම් ජාලයක් හරහා මූල්‍යමය ගනුදෙනුවලට පහසුකම් සලසනු ඇත.

2. **ගාස්තු සහ අය කිරීම්**

2.1 LANKAQR කේත මගින් ආරම්භ කළ ගනුදෙනු කිසිවකටත් පාරිභෝගිකයාගෙන් අය කිරීම් කළ නොහැක.

2.2 වෙළෙඳ වට්ටම් අනුපාතය (Merchant Discount Rate) ස්වරූපයෙන්, වෙළෙඳුන්ගෙන් ගාස්තු අය කළ හැක.

2.3 වෙළෙඳුන් විසින් අවසන් පාරිභෝගිකයාගෙන් වෙළෙඳ වට්ටම් අනුපාතයේ ගාස්තුව පූර්ණ/අර්ධ වශයෙන් පියවා නොගන්නා බවට සහතික වීමට, ගනුදෙනු අත්පත්කරුවන්ට දැඩි ලෙස අවවාද කෙරේ.

2.4 LANKAQR කේතය වෙළෙඳපොළෙහි වේගවත්ව හා පුළුල්ව සම්මත වීම ධෛර්යමත් කිරීම පිණිස, ගනුදෙනු අත්පත්කරුවන් විසින් අවම වෙළෙඳ වට්ටම් අනුපාතයන් පවත්වා ගෙනයාමට වගබලා ගත යුතුය.

2.5 ආරම්භයේදී ගනුදෙනු අත්පත්කරුවන් අතර ඵලදායී තරගකාරීත්වයක් නිර්මාණය කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළෙඳ වට්ටම් අනුපාතයන් තීරණය කිරීමට වෙළෙඳපොළ බලවේගයන්ට ඉඩදෙනු ඇත. එනමුදු, අවශ්‍යතාවයක් පැන නැගේ නම්, වෙළෙඳ වට්ටම් අනුපාතයන් ස්ථාවර හා විධිමත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත් වනු ඇත.

2.6 ගනුදෙනු අත්පත්කරුවන්, වෙළෙඳ අත්පත්කරුවන්, නිකුත් කරන්නන් හා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම යන අදාළ පාර්ශව සියල්ල අතර 1% ක වෙළෙඳ වට්ටම් අනුපාතයක් බෙදී යන ආකාරයක උදාහරණයක් වගු අංක 1 හි දැක්වේ. වෙළෙඳ වට්ටම් අනුපාත අගය වෙනස් විය හැකි නමුදු, ගනුදෙනු අත්පත්කරුවාට හැර වගු අංක 1 හි නම් කර ඇති අනෙකුත් පාර්ශවකරුවන්ගේ අනුපාත අගයන් වෙනස් කළ නොහැක. තවද, ගනුදෙනු අත්පත්කරුවන් විසින් වෙළෙඳ වට්ටම් අනුපාතය එකතු කර වගු අංක 1 හි දක්වා ඇති අනුපාතයන්ට අනුකූලව අදාළ පාර්ශවයන් හට බෙදා හරිනු ලැබේ.

2.7 ගනුදෙනුවක් ආපසු හරවන අවස්ථාවකදී, පූර්ණ නිෂ්කාශණ ජාල ගාස්තුව (ආපසු නොගෙවන ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ ගාස්තුව) ගනුදෙනු අත්පත්කරුවා විසින් දරනු ලැබේ.

**වගු අංක 1: අදාළ පාර්ශව සියල්ල අතර 1% වෙළෙඳ වට්ටම් අනුපාතයන් බෙදී යන ආකාරය**

| ගනුදෙනු අගය X රුපියල් | ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ ගාස්තුව රුපියල් | නිකුත් කරන්නාගේ ගාස්තුව | ගනුදෙනු අත්පත්කරුවාගේ ගාස්තුව | වෙළඳ අත්පත්කරුවාගේ ගාස්තුව |
|---|---|---|---|---|
| 10 <= X <=100 | 0.01 | 0.25% | 0.35% (ජංගම යෙදුම් මෘදුකාංග සපයන්නා සමඟ බෙදා ගත යුතුය) | 0.40% දක්වා (වෙළෙඳපොළ බලවේග විසින් තීරණය කරනු ලැබේ) - ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ ගාස්තුව |
| 100 < X <= 1000 | 0.10 | | | |
| 1000 < X <= 5000 | 1.00 | | | |
| 5000 < X | 3.00 | | | |

3. **ගනුදෙනු සීමාවන්**

3.1 LANKAQR කේත ගනුදෙනු සඳහා අවම ගනුදෙනු සීමාව රු.10.00 වේ.

3.2 LANKAQR කේත ගනුදෙනු සඳහා උපරිම ගනුදෙනු සීමාව, පුද්ගල අවදානම් සාධකවලට යටත්ව, අත්පත්කරුවා විසින් තීරණය කරනු ලැබේ.

**4. ගනුදෙනු දැනුම්දීම්**

4.1 නිකුත් කරන්නන් විසින් ගනුදෙනුවෙහි තත්ත්වය පිළිබඳව, තත්කාලීනව, කෙටි පණිවිඩයක් ඔස්සේ පාරිභෝගිකයා හට දැනුම් දිය යුතුය

4.2 වෙළෙඳ අත්පත්කරුවන් විසින් ගනුදෙනුවෙහි තත්ත්වය පිළිබඳව, තත්කාලීනව, වෙළෙන්දා සමඟ එකඟ වූ, සුදුසු ක්‍රමයක් ඔස්සේ වෙළෙන්ඳන් හට දැනුම් දිය යුතුය.

**5. නිෂ්කාශන ජාල නියාමකයා**

5.1 LANKAQR කේත පදනම් කරගත් ගෙවීම් ක්‍රියාවලි සඳහා ප්‍රධාන පහසුකම් සපයන්නා ලෙස ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම නම් කර ඇති අතර ඔවුන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් අනුමත කළ පරිදි මෙම ක්‍රියාවලියට අදාළ මෙහෙයුම් මාර්ගෝපදේශයන් හා වෙළෙඳ නාම මාර්ගෝපදේශයන් නිකුත් කරනු ඇත. LANKAQR කේත මඟින් ආරම්භ කළ ගනුදෙනු සඳහා සහභාගි වන සියලුම පාර්ශවයන් විසින්, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම මඟින් නිකුත් කරන මෙම මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

ඩී. කුමාරතුංග

**අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්**